# කපුටා සහ කේජු කැල්ල

දවසක් නරියෙක් හරිම
බඩගින්නෙන් කැලේ මැදින්
යනකොට කේජු කැල්ලක් කන්න
හරි බරි ගැහෙන කපුටෙක්
ගහක අත්තක ඉන්නවා දැක්කා.

කපුටාගේ කටේ තිබුණු කේජු කැල්ල අරගන්නේ කොහොමද කියලා නරියා කල්පනා කළා.

"නුඹ නම් මහා කැතම කැත කපුටෙක්. නුඹ තරම් කැත කපුටෙක් මම කවදාවත් දැකලා නැහැ. ලෝකෙම ඉන්න කපුටෝ ඔක්කොම එක්ක තිබ්බත් එයින් කැතම කැත කපුටා නුඹ තමයි" නරියා කිව්වා.



නරියගේ මේ කතාවෙන් කපුටට හොඳටෝම කේන්ති ආවා.

'' නුඹ පුදුම නරියෙක්නේ. නුඹ මොකද මට ඔය තරම් අපහාස කරන්නේ..? මොකක්ද මම නුඹට කරපු වැරැද්ද?' කපුටා ඇහුවා. එතකොටම කටේ තිබුණු කේජු කැල්ල බිමට වැටුණා.



නරියා බෙහෝම සතුටින් කේජු කෑල්ල අරගෙන කැලේ පැත්තට යන්න ගියා.